දිනමිණ

The Dinamina | 1909 ඇරැඹී ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | දිනමිණ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ විජේ අව් දිවසක ලත් සඳු දින | කාණ්ඩය 111 | පත්‍රය 273 | පිටු 28 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 නොවැම්බර් 02 සඳුදා

කොවිඩ් ව්‍යාප්තිය



බාලත්‍රයේ සිසිටල් දොරටුව අද පත්‍රය සමඟ

දිස්ත්‍රික්ක අතර සංචරණය තහනම්

ඇඳිරි නීති බලපත් නිකුත් කරන්න එපා

බස්නාහිර ඇඳිරි නීතිය 9 දා තෙක් දීර්ඝ කරයි

නිවෙස්වල නිරෝධායනය වන්නන්ට රු. 10,000ක දඩමුගුරක්

කොවිඩ් ව්‍යාප්තිය මර්දනයට

ධනුෂ්ක ගොඩකුඹුර, නුවන් කොඩිකාර

ආහාර ඖෂධ ඇතුළු අත්‍යවශ්‍ය සේවා බෙදා හැරීම හැර දිස්ත්‍රික්ක අත... තහනම් කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රදානත... (01) රැස් වූ කොවිඩ් මර්දන ජනාධිපති කාර්ය සාධක බළකාය තීරණය ක...

STF තවත් පොකුරක් වෙයි ද?

රුවන්ත නිතුල්ගස්පිටිය

...ය, සෞඛ්‍ය අංශ, යුද හමුදාපතිවරයා, පොලිස්පතිවරයා, විශේෂ කාර්ය බළකා ...ණදෙන නිලධාරිවරයා ඇතුළු ආරක්ෂක අංශ ප්‍රධානීන් නිරන්තරයෙන් ...ත් කරන සෞඛ්‍ය උපදෙස් සහ වසංගත තත්ත්වය හමුවේ රාජකාරී සඳහා ...ාරීන් යොදවාගන්නා ආකාරය සම්බන්ධයෙන් නිකුත් කළ චක්‍රලේඛ කිසිවක් ...නකට නොගෙන අත්තනෝමතිකව පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරීන් ...ාරී කටයුතු සඳහා යොදවා ආරක්ෂක අංශ ආශ්‍රිතව තවත් කොවිඩ්-19 ...පොකුරක් සක්‍රීය කිරීමට අනියමින් දායකත්වය සපයන විශේෂ කාර්ය බළකා ...ධානයේ ස්ථානාධිපතිවරයා සහ සහකාර පොලිස් අධිකාරිවරයකු පිළිබඳ ...පොකුරු 'දිනමිණ' ට වාර්තා වෙයි. පිට 06

CLICK

කොවිඩ්-19 වයිරසයේ වර්ධනය ඉතා වේගවත්

පෙර වයිරසයට වඩා වේගයෙන් පැතිරයන බව පර්යේෂණවලින් හෙළි වෙයි

බුද්ධිකා ඉඹුලාන, සන්ධ්‍යා කරුණාරත්න

මේ වන විට ව්‍යාප්ත වී ඇති කොවිඩ් 19 වයිරස් ප්‍රභේදය ඉතා වේගයෙන් ශරීරය තුළ වර්ධනය වන බවත්, ශීඝ්‍රයෙන් පැතිර යෑමේ හැකියාවක් ඇති බවත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිදු කරන ලද පර්යේෂණයකින් හෙළිවෙයි. පිට 06

මිනුවන්ගොඩ-පෑලියගොඩ කොවිඩ් පොකුරු 7378ට නඟී

සන්ධ්‍යා කරුණාරත්න

මිනුවන්ගොඩ සහ පැලියගොඩ කොවිඩ් - 19 පොකුරුවලට අදාළව වයිරසය ආසාදිතයන් 7378ක් ඊයේ (01) වන විට වාර්තා වී තිබේ. පිට 06

පොලීසියේ 105කට කොරෝනා

රක්ෂණ ශ්‍රියන්ත

පොලිස් නිලධාරීන් 105 දෙනකු මේ වන විට කොවිඩ් 19 වයිරස ආසාදිතයන් ලෙස හඳුනාගෙන තිබේ. පිට 06

20 වැනි කොරෝනා

රටවැ... ආරක්...

රතන සූත්‍රය සජ්ඣායනා කරන්න

අගමැති මහා සංඝරත්නයෙන් ඉල්ලයි

කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ රටට හා රටවැසියාට ආරක්ෂාව පතා දිවයිනේ සෑම විහාරස්ථානයකම රතන සූත්‍රය සජ්ඣායනා කරන ලෙස අගමැති මහින්ද රාජපක්ෂ මහතා මහා සංඝරත්නයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටියි. පිට 06

...000 ...ම් දෙවැනි අදියර හෙට ඇරඹේ

මහින්ද අලුත්ගෙදර

ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ශ්‍රමිකයන් දිස්ත්‍රික්කයේ පවුල් 464,000ක් සඳහා රුපියල් 5,000 බැගින් දීමේ දෙවන අදියර හෙට (03) ආරම්භ කෙරෙන අතර ඒ වෙනුවෙන් රජය වෙන් කර තිබෙන මුදල් රුපියල් මිලියන 2,321කි. පිට 06

ඇඳිරි නීතිය කැඩූ 1633ක් අත්අඩංගුවට

රක්ෂණ ශ්‍රියන්ත

නිරෝධායන ඇඳිරි නීතිය පැනවූ ඔක්තෝබර් 04 සිට මේ දක්වා කාලය තුළ නිරෝධායන ඇඳිරි නීතිය කඩ කිරීම සම්බන්ධයෙන් පුද්ගලයන් 1633ක් අත්අඩංගුවට ගෙන ඇති අතර වාහන 253ක් පොලිස් භාරයට ගෙන තිබේ.

ඊයේ (01) උදෑසන 6.00 දක්වා වූ පැය 24 තුළ නිරෝධායන ඇඳිරි නීතිය කඩ කළ පුද්ගලයන් 153 දෙනකු අත්අඩංගුවට ගෙන ඇති අතර වාහන 35ක් පොලිස් භාරයට ගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා පවසයි. පිට 06

වත්තල-කෙරවලපිටිය-හොරණ කර්මාන්තශාලා 3ක් වසයි

පිට 6

දෙමළ ජාතික සන්ධානයේ හවුල්කාර පක්ෂ අවුලක

පිට 6

දැඩි සත්කාර ඇඳන් 477ක් සූදානමින්

ඇඩ්‍රියන් මුහුදේ භූකම්පනයකින් 27ක් මරුට

කොරෝනා මඬින්න එකාවන්ව සහාය දෙන්න

තිස්ස අත්තනායක

සුහාෂිණී සේනානායක

කොවිඩ් උවදුර ජාතික උවදුරක් සේ සලකා එක්ව එය මෝදනය කිරීමට කටයුතු කළ යුතු වන බව සමගි ජන බලවේගයේ ජාතික සංවිධායක, පත් කළ මන්ත්‍රී තිස්ස අත්තනායක මහතා පවසයි.

මේ අවස්ථාවේ කොවිඩ් ව්‍යාප්තිය අවම කිරීමට ජනතාව ද සහාය විය යුතු බව පෙන්වා දෙන ඒ මහතා සෞඛ්‍ය උපදෙස්වලට අනුව කටයුතු කරමින් ඒ සඳහා ජනතාවගේ සහාය රජයට මෙන්ම සෞඛ්‍ය අංශවලටත් දක්වන ලෙසට ද සමස්ත ජනතාවගෙන්